# ECPAT Sri Lanka සංවිධානය විසින් දරුවන් වෙනුවෙන්, අන්තර්ජාලය ඔස්සේ සංවිධානය කරනු ලබන කථික තරගාවලිය

## ඔබේ අදහස් දැක්වීමේ කුසලතා ඉදිරිපත් කිරීමට ඔබත් කැමතිද?

## අදහස් වලට හඬක් දීමට ඔබටත් අවස්ථාවක්

කොවිඩ්-19 වසංගතය සෑම කෙනෙකුටම එදිනෙදා ජීවිතයේ විශාල වෙනස්කම් සමග කටයුතු කිරීමට බල කර ඇති අතර ශාරීරික දුරස්ථභාවය සහ නිවෙස් තුළ හුදෙකලා වී සිටින දරුවන්ට අවස්ථාවක් ලබා දීමට ECPAT Sri Lanka සංවිධානය නිරන්තරයෙන් උත්සහ කරයි. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් දරුවන් දරුවන් දහස් ගණනක් සහභාගී කර ගනිමින් සාර්ථක චිත්‍ර තරගාවලියක් පැවැත්වීමට ECPAT Sri Lanka සංවිධානයට හැකියාවක් ලැබුනු අතර සියලුම ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග පිරිනමන ලදී.

ඒ අනුව, ECPAT Sri Lanka සංවිධානය විසින් කථන තරගයක් සංවිධානය කිරීමට අදහස් කරනු ලබන අතර, වයස අවුරුදු 8-16 අතර දරුවන්ට ඒ සඳහා සහභාගී වීමට ආරාධනා කරයි. මෙම තරගය දරුවන්ට ඔවුන්ගේ කථන කුසලතා වර්ධනය කර පෙන්වීමටත් වටිනා මුදල් ත්‍යාග දිනා ගැනීමටත් අවස්ථාවක් ලබා දෙයි. තවද මෙම තරගාවලිය, ස්වයං නිරෝධායන හා හුදෙකළාව ගත කරන කාලය තුළ දරුවන් හට ආත්ම විශ්වාසය, විචාරාත්මක චින්තනය සහ සංස්කෘතික අවබෝධය ද ප්‍රවර්ධනය කරයි. කථන තරගය සඳහා තේමාවන්, වයස් කාණ්ඩ අනුව පහතින් දක්වා ඇත. ඔබට සිංහල හෝ දෙමළ භාෂාවෙන් අදහස් ඉදිරිපත් කළ හැකිය. එසේම අදහස් දැක්වීම ස්මරණයෙනන් සිදු කළ යුතුය.

තරගකරුවන් ඔවුන්ගේම සොයාගැනීම් හරහා ඔවුන්ගේ අත්දැකීම් ඇතුළත් කථාවක් විනාඩියක පැහැදිලි වීඩියෝ පටයක් ලෙස අප වෙත එවිය යුතු වේ. තරගකරුවන් තමන්ගේ කථාව කිසිදු ආකාරයේ සංස්කරණයකට භාජනය නොකල යුතු අතර පැහැදිලිව පටිගත කරන ලද විනාඩියකට නොවැඩි කථාව 2020 ජුනි 15 වන විට ECPAT Sri Lanka සංවිධානයට Viber,whats app හෝ විද්‍යුත් තැපෑල, හරහා එවිය යුතුය.

**තරගය සඳහා ඇතුළු වීම ඉතා පහසුය!**

**ඔබ කළ යුතු දේ :**

- දී ඇති මාතෘකාව කියවා තේරුම් ගන්න. කොවිඩ්-19 පිළිබඳ ගවේෂණය කර ඔබේ කථාව සූදානම් කිරීමට ඔබට අවස්තාව ඇත.
- ඔබ මාතෘකාවට අදාළ වන ප්‍රධාන වචන පිළිබඳ අවධානය යොමු කරන්න.
- කථාව **සිංහල හෝ දෙමළ** භාෂාවෙන් සකස් කරන්න.
- වචන හා අභිනයන් භාවිතයෙන් ඔබේ කථාව සජීවීකරණයට ගෙන ඒමට පුහුණු වන්න.
- ඔබේ කථාව **විනාඩියකට සීමා කිරීමට** වග බලා ගන්න.
- **2020 ජුනි 15** වන විට වීඩියෝ පටය වට්ස් ඇප්, වයිබර් හෝ විද්‍යුත් තැපෑලෙන් අපවෙත එවන්න.
- වට්ස් ඇප්, වයිබර්(සිංහල මාධ්‍ය ) - 070 4540 221
- වට්ස් ඇප්, වයිබර්(දෙමළ මාධ්‍ය ) - 071 295 0615
- විද්‍යුත් තැපෑල - ecpatlk@gmail.com

**වෙනත් කිසිදු මාධ්‍යයකින් ඉදිරිපත් කරන අයදුම් කිරීම් පිළිගනු නොලැබේ.**

## සහභාගී වීමට සුදුසුකම් ලබන්නේ කවුද?

**පහත සඳහන් වයස් කාණ්ඩවල ළමුන් මේ සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන්ගේ තේමාවන් පහත පරිදි වේ.**

- 1 වන කාණ්ඩය අවුරුදු 08 - 10 අතර - ඔබ කොරෝනා කාලයේ සතුටින් ද දුකින් ද? එහෙනම් ඒ ඇයි?
- 2 වන කාණ්ඩය අවුරුදු 11 - 13 අතර - කොරෝනා එක්ක අලුත් වූ අපේ ජීවිත
- 3 වන කාණ්ඩය අවුරුදු 14 - 16 අතර - කොවිඩ් - 19 අභියෝගයක් ද? අවස්ථාවක් ද?

## මුදල් ත්‍යාග

- එක් එක් කාණ්ඩයේ පළමු දෙවන හා තෙවන ස්ථාන දිනාගන්නා දරුවන්ට පිළිවෙලින් රුපියල් 10000, 7500 සහ 5000 බැගින් මුදල් ත්‍යාග පිරිනැමේ.

## තරඟ නීති රීති

1. නිශ්චිත වයස් කාණ්ඩ නියෝජනය කරන සියලුම දරුවන්ට විවෘතයි.
2. සෑම අයදුම් කිරීමක්ම අදාල තරගරුවාගෙ නිර්මාණයක් විය යුතුයි.
3. එක් තරගකරුවෙකුට අවසර දී ඇත්තේ එක් අයදුම් කිරීමකට පමණි.
4. තරගකරුට තරගයට ඇතුළුවීමට ඔහුගේ /ඇයගේ දෙමව්පියන්ගේ අවසරය තිබිය යුතුය.
5. 2020 ජුනි 15 මධ්‍යම රාත්‍රියට පෙර අයදුම්පත් ලැබිය යුතුය.
6. තරගකරුවන් විසින් ඔවුන්ගේ කථාව ඉදිරිපත් කරන වීඩියෝව එක් වරකදී වීඩියෝ ගත කළ එකක් විය යුතු අතර සංස්කරණයකින් තොරව එවිය යුතුය ,කෙසේ වෙතත් සහභාගිවන්නන්ට ඔවුන්ගේ වීඩියෝව පටිගත කිරීමට පෙර කිහිප වතාවක් පුහුණු කළ හැකිය.
7. කොටස් එකට සංස්කරණය කළ වීඩියෝ පිළිගනු නොලැබේ.
8. වීඩියෝව විනාඩියක කාලය නොඉක්මවිය යුතුය.
9. තරගකරුවන් සුදුසු පරිදි සැරසී සිටිය යුතුය. (කෙටි සායවල් කොට කලිසම් ආදිය නුසුදුසු වේ)
10. වට්ස් ඇප්,වයිබර් සහ විද්‍යුත් තැපැල් අයදුම් කිරීම් පමණක් පිළිගනු ලබන අතර වෙනත් ක්‍රම මගින් එවන ලද අයදුම් කිරීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. තරගයට පෙර හෝ පසුව දුරකථන ඇමතුම් ලබා දීමෙන් වැලකී සිටින්න.
12. කථාව සිංහල හෝ දෙමළ භාෂාවෙන් කළ යුතුය.
13. සහභාගිවන්නන් වීඩියෝ පටය තුළ තමන් ගැන කෙටි පැහැදිලි කිරීමක් ඇතුළත් කළ යුතුය. මෙයට ඇතුළත් විය යුතු වන්නේ තමාගේ පළමු නම, ශ්‍රේණිය සහ පාසල වේ.
14. තරගකරුගේ විස්තර නම උපන් දිනය පාසල ලිපිනය සහ දුරකතන අංකය වීඩියෝව සමග එවිය යුතුය.
15. විනිසුරුවන්ගේ තීරණය අවසාන තීරණය වේ.

## විනිශ්චය කිරීමේ නිර්ණායක

- කථාවේ ඉදිරිපත් කර ඇති කරුණු සහ තේමාව සමග ඒවායේ සම්බන්ධතාවය.
- පැහැදිලිබව සහ පරිමාව.
- උච්ඡාරණය සහ හඬ පාලනය.
- කථාව අභිනයෙන් ඉදිරිපත් කිරීම.

- රිද්මය සහ පියවර.
- කැමරාව සමග තිබෙන සබඳතාව.(කැමරාවට කථා කිරීම).
- සමස්ත ඉදිරිපත් කිරීම.
- සම්පූර්ණ නම, වයස සහ පාසල ඇතුළත් ස්වයං හැඳින්වීමක් කරන්න.

ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් විසින් ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ. ප්‍රමාද වූ ප්‍රවේශයන් කිසිදු තත්ත්වයක් යටතේ පිළිගනු නොලැබේ.

ජයග්‍රාහකයින් **2020 ජූලි 06** වන විට ECPAT Sri Lanka ෆේස්බුක් පිටුවේ ප්‍රකාශයට පත් කෙරේ. ජයග්‍රාහී කථාවල වීඩියෝ සහ ජයග්‍රාහකයින්ගේ විස්තර ECPAT Sri Lanka ෆේස්බුක් පිටුවේ සහ වෙබ් අඩවියේ පළ කෙරේ.